සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

PMoE Sabaragamuwa

**අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு

මගේ අංකය / எனது இல / My Number: ME/E/1 (සබර/චක්‍රලේඛ)

ඔබේ අංකය / உமது இல / Your Number:

දිනය / திகதி / Date: 2023.07.[?]

**Ministry of Education, Information Technology & Cultural Affairs**

Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

---

සබරගමුව පළාත් සභා පාසල් වල සියළුම විදුහල්පතිවරු වෙත,

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ**
**සබර/2023/04**

**<u>මුදල් අයකර පෞද්ගලික පන්ති පැවැත්වීම / ගුරුවරුන්ගේ විනය සම්බන්ධවයි</u>**

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක සබර/2016/08, සබර/2022/05 හා අධ්‍යාපන අමාත්‍යාංශ 2012/37 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එයට වැඩිමනත් වශයෙන් චක්‍රලේඛ අංක සබර/2023/04 මගින් සබරගමුව පළාතේ ගුරු භවතුන් හට තමන් උගන්වන සිසුදරුවන්ට පාසලේදි හෝ ඉන් පරිබාහිර වෙනත් ස්ථානයකදී මුදල් අයකරමින් උපකාරක පන්ති පැවැත්වීම තහනම් කරමි.

02. ඉහත චක්‍රලේඛ හා උපදෙස් උල්ලංඝනය කරමින් තවදුරටත් ඇතැම් ගුරුවරුන් මුදල් අයකරමින් පෞද්ගලික උපකාරක පන්ති පවත්වනු ලබන බවට තොරතුරු ලැබෙමින් පවතී. මෙහිදී පාසලේ තමන් උගන්වනු ලබන දරුවන් සඳහා තම උපකාරක පන්තියට සහභාගී වන ලෙසට ගුරුවරුන් විසින් විවිධ බලපෑම් එල්ල කරනු ලබන බවද, එලෙස එම පන්ති සඳහා සහභාගි නොවන අවස්ථාවලදී එම දරුවන් විවිධ මානසික හා කායික පීඩාවන්ට ලක් කරන බවද, එම ගුරුවරුන් තම පාසල් ඉගැන්වීම් කටයුතු සඳහා අවධානයක් යොමු නොකරන බවද මා වෙත දිගින් දිගටම පැමිණිලි ඉදිරිපත් වේ. මේ හේතුවෙන් දරුවන් මෙන්ම දෙමාපියන්ද පීඩනයට හා අසරණභාවයට පත්ව ඇත.

03. එබැවින් ආසන්නතම මාණ්ඩලික නිලධාරියා ලෙස ඔබගේ දැඩි අධීක්ෂණය මේ සම්බන්ධව යොමු විය යුතු බවත් ඉහත චක්‍රලේඛ උපදෙස් තරයේ පිළිපදින ලෙසත් අවධාරණය කරමි. මේ පිළිබඳව ඔබ පාසලේ ගුරුවරුන් දැනුවත් කිරීම විදුහල්පතිවරයා ලෙස ඔබගේ වගකීම බව දන්වා සිටින අතර මෙම උපදෙස් නොසලකා හරින ගුරුවරයෙකු වේ නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හරහා මා දැනුවත් කරන මෙන් දන්වා සිටිමි. ඉහත තත්ත්වයන් වලක්වා ගැනීමට කටයුතු නොකරන ගුරුවරුන්හට හා ආසන්නතම මාණ්ඩලික නිලධාරියා ලෙස අදාල විදුහල්පතිවරයාටත් දැඩි විනය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවද දන්වා දන්වා සිටිමි.

04. මේ සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති දෙමාපියන් දැනුවත් කිරීමේ දැන්වීම A 3 ප්‍රමාණයේ කඩදාසියක ජායා පිටපත් ගෙන ලැමිනේට් කර ඔබ පාසලේ පිවිසුම් දොරටුව ඉදිරිපස ප්‍රදර්ශනය කල යුතු බවත් මෙයින් උපදෙස් ලබාදෙමි.

සුජානි ආර්.විජේතුංග.
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නව නගරය රත්නපුර

පිටපත්
01. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.
02. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය, ස.ප.ස. - කා.දැ.පි.
03. සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - .දැ.පි. හා අ.ක.ස.
04 . සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු - දැ.පි. හා අ.ක.ස.
05. සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු - දැ.පි. හා ඔබගේ කොට්ඨාසයට අයත් පාසල් වල විදුහල්පතිවරුන් වෙත මෙම චක්‍රලේඛය බෙදා හැරීම සඳහා.

Scanned with CamScanner

# දැනුම්දීමයි

පාසලේ ගුරුභවතුන් හට තමා උගන්වන පංති වල සිසු දරු දැරියන්හට පාසලේදී හෝ ඉන් පරිබාහිර ස්ථානයකදී මුදල් අයකරමින් උපකාරක පන්ති පැවැත්වීම තහනම් කරමින් මා විසින් 2023.07.17 දිනැති සබර /2023/04 චක්‍රලේඛය නිකුත් කර ඇත. ඒ සම්බන්ධයෙන් යම් පැමිණිල්ලක් වේ නම් පහත දුරකථන අංකයට හෝ ලේකම්, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර යන ලිපිනයට දැනුම් දෙන ලෙස දන්වා සිටිමි. පැමිණිලි සම්බන්ධ රහස්‍යභාවය සුරකින බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

දුරකථන අංකය : - 0729405072
ඊමේල් ලිපිනය : - seducationinquiry@gmail.com

සුජානි ආර්.විජේතුංග.
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

Scanned with CamScanner